117

දිරි දිමනා චක්‍රලේඛ අංක 53

අපේ අංකය : සං/ ප්‍රති/ 99
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
1999.01 - 02 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්
සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කළුතර / කෑගල්ල)

## මිශ්‍ර වගා යටතේ තේ වගාකිරීම

1.0 චක්‍රලේඛයේ පරමාර්ථය

1.1 ශාඛ විවිධත්වයට රැකගැනීමත්, පරිසරය ආරක්ෂා කර ගැනීමත්, ප්‍රජා අවශ්‍යතා සපුරාලීම සඳහාත් තේ වගාව තුල තේ වගාවට අමතරව විවිධ ශාඛ පවත්වාගෙන යාමට ඉඩදීම.

2.0 මිශ්‍ර භෝග යටතේ තේ වගා කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග පිළිබඳව 1989.03.10 දිනැති චක්‍රලේඛ අංක 18 මගින් නිකුත් කරන ලද උපදෙස් මෙම චක්‍රලේඛය මගින් අවලංගු කරන අතර, එය වෙනුවට මෙම අංක චක්‍රලේඛය ආදේශ කරගන්නා ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ..

3.0 ක්‍රියා පිළිවෙත

තේ වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණයේ පහත සඳහන් කර ඇති තෝරාගනු ලබන ශාඛ වලට උපරිම වශයෙන් 50% ක බිම් ප්‍රමාණයක් ඉඩ හරිමින් යටත් පිරිසෙයින් ඉතිරි 50% ක බිම් ප්‍රමාණයකවත් මිශ්‍ර වගා වලින් අවහිරයක් ඇති නොවන පරිදි තේ වගාව පවත්වා ගෙන යාමට හැකිවිය යුතුය. ඉඩම් හිමියන් විසින් නොළදුරා තබාගත යුතු යයි අපේක්ෂා කරනු ලබන ශාඛ, ප්‍රජා අවශ්‍යතා අනුව වර්ගීකරණය කර ඇති අතර, නිර්දේශිත මිශ්‍ර භෝගයන් සඳහා අඩුකල යුතු බිම් ප්‍රමාණයන් පහත දැක්වෙන පරිදි අඩු කරමින් අවසර පත්‍ර නිකුත් කිරීම කළයුතුවේ.

4.0 මිශ්‍ර වගා සඳහා අඩු කළයුතු බිම් ප්‍රමාණය

| ශාඛ කාණ්ඩය | ශාඛ වර්ගය/ කුලය | එක් ශාඛයක් සඳහා අඩු කරන උපරිම බිම් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | පර්චස් | හෙක්ටයාර් |
| පූජනීය තත්වයේ ලා සලකන ශාක | 1. බෝ/ නුග/ නා<br>2. සල් | 10<br>01 | 0.0253<br>0.0025 |
| පෝෂණ වටිනාකමකින් යුත් ශාඛ | 1. කොස් සහ දෙල් වර්ග | 02 | 0.0051 |
| පළතුරුමය වටිනාකමකින් යුත් ශාඛ | 1. අලිපේර/ අඹ/ මොර/ මැන්ගුස්ටින්/ අම්බරැල්ලා/ කජු/ සැපදිල්ලා/ ලාවුළු/ වෙරළු/ උගුරැස්ස/ රඹුටන්/ කාබරන්ගා/ දූරියන්<br>2. බෙලි/ දිවුල්/ පිණිජම්බු/ පෙයාර්ස්/ ලොවි/ පේර | 1.5<br>0.5 | 0.0037<br>0.0012 |

| ශාඛ කාණ්ඩය | ශාඛ වර්ගය/ කුලය | එක් ශාඛයක් සඳහා අඩු කරන උපරිම බිම් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | පර්චස් | හෙක්ටයාර් |
| රසකාරක ශාඛ | ගොරක/ සාදික්කා/ සියඹලා | 1.5 | 0.0037 |
| දැවමය වටිනාකමකින්යුත් ශාඛ | ලුණුමිදැල්ල/ මිල්ල වගී/ මැහෝගනි/ රුක් අත්තන/ දේවදාර/ කීණ/ දූනා/ සපු වගී/ තේක්ක/ බුරුත/ කුඹුක්/ වැලිපැන්න/ නැදුන්/ ඇලස්ටෝනා (ගිණිකුරු)/ දවට/ ටර්පන්ටයින්/ පයිනස්/ වීර/ පලු/ සංසූරිය/ දඹ | 1.5 | 0.0037 |
| ඖෂධීය වටිනාකමකින් යුත් ශාඛ | 1. කොහොඹ/ ගම්මාළු/ කැටකාල/ කැකුණ/ මී/ අරළු/ බුළු/ දොඹ<br>2. සඳුන්/ තෙල්ලි/ තික | 01<br>0.2 | 0.0025<br>0.0005 |
| පැහිරි ශාඛ | පැහිරි කුලයේ සියළුම ශාඛ | 0.2 | 0.0005 |
| වෙනත් ශාඛ | කිතුල්/ තල්/ පොල් තාල කුලයේ ශාඛ | 0.5 | 0.0012 |
| ශාඛ වැටි | පුවක්/ කුරුඳු නිර්දේශ කෙරේ. වීසිරී ඇති අවස්ථාවල පර්. 0.2 බැගින් අඩුකල යුතුය. | | |

4.1 අතුරු වගාවන් යටතේ නිර්දේශ වගාවන් අතර තිබිය යුතු පරතරය

| ගස් වර්ගය | පරතරය අඩි | අක්කරයකට තිබිය හැකි උපරිම ගස් ගණන |
|---|---|---|
| කෝපි | 20'x 20' | 110 |
| ගම්මිරිස් | 20'x 20' | 110 |
| කරාබු | 40'x 40' | 30 |
| කොකෝවා | 40'x 40' | 30 |

කෝපි, ගම්මිරිස්, කරාබු හා කොකෝවා ඉහත පරතරයට අනුව වගාකර ඇත්නම් කිසිම බිම් ප්‍රමාණයක් අඩු නොකොට තේ වගා කිරීමට අවසර දිය හැකිය.

116

5.0 වෙනත් විශේෂ කරුණු

(1) නිර්දේශිත පරතරය ඉක්මවන අවස්ථාවලදී වැඩිපුර වගාව ඉවත් කිරීමට ඉල්ලුම්කරු එකඟවී ඉවත් කළයුතුය.

(11) මිශ්‍ර වගාවන් සඳහා අඩු කිරීමේ උපරිම බිම් ප්‍රමාණය අක්කරයට ප. 40 කි.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) - දැනගැනීම සඳහා
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) - දැනගැනීම සඳහා
3. සහකාර සාමාන්‍යාධිකාරී (කම්හල්)
4. සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
5. සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)
6. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)
7. අභ්‍යන්තර විගණක
8. මුදල් කළමනාකරු
9. සියලුම මාණ්ඩලික නිලධාරීන්
10. සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්
11. ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීන්
12. ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
13. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
14. ලේකම් - සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය

AV-SU/53